(14)

03

244082

NATIONAL LIBRARY
N L S L OF SRI LANKA
27/06/2023
13:01:17

14-7-1993

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 763/8—1993 අප්‍රේල් 21 වැනි බදාදා—1993.04.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.— බී 19/72.

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනත**

1981 අංක 9 දරන පනතින් සහ 1982 අංක 16 දරන පනතින් සංශෝධිත 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනතේ 3(5) සහ 10 වන වගන්ති යටතේ වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

ඇලික් අලුවිහාරේ,
වරාය හා නාවික කටයුතු අමාත්‍ය,

1993 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1991 ඔක්තෝබර් 17 වැනි දින අංක 684/9 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1992 ජුලි 23 වන දින අංක 724/9 දරන ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරනු ලැබූ 1991 නැව් නියෝජිතයන්ට (බලපත්‍ර දීමේ) නියෝග, එහි 5 වන නියෝගය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

"5. (1) කිසියම් සමාගමක්—

(අ) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවනු ලැබ ලියාපදිංචි කර ඇති හෝ පිහිටුවා ලියාපදිංචි කරනු ලබන සමාගමක් වන්නේ නම් මිස ;

සහ

(ආ) (i) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් ගෙවා නිමි ප්‍රාග්ධනයක් සහ එසේ නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක බැංකු ඇපකරයක් සහිත පොදු හෝ පුද්ගලික සමාගමක් වන්නේනම් මිස ;

හෝ

(ii) එහි කොටස්වලින් සියයට හැටකට නොඅඩු ප්‍රමාණයක් ශ්‍රී ලංකා පුරවැසියන්ට අයත්වන වගකීම සීමාසහිත පොදු හෝ පුද්ගලික සමාගමක් වන්නේ නම් මිස

ඒ සමාගම නැව් නියෝජිතයකු වශයෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බලපත්‍රයක් ලැබීම සඳහා සුදුසු නොවිය යුතුය.

(2) මෙම නියෝගවල කාර්යය සඳහා ශ්‍රී ලංකා පුරවැසියකු යන්නෙන් —

(අ) (349 වන අධිකාරය වූ) පුරවැසි පනතට අනුකූලව ශ්‍රී ලංකා පුරවැසියකු වන ස්වාභාවික පුද්ගලයකු ;

(ආ) හවුල් ව්‍යාපාරයෙහි ප්‍රාග්ධනයෙන් සියයට හැටකට නොඅඩු ප්‍රමාණයක් ශ්‍රී ලංකා පුරවැසියන්ට අයත් වන හවුල් ව්‍යාපාරයක්;

(ඇ) අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරය ශ්‍රී ලංකා පුරවැසියන් වන ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ හා කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ නිල ලැයිස්තුගත පොදු සමාගමක් ;

NATIONAL LIBRARY OF SRI LANKA 27/06/2023 13:01:17



(ඇ) අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරය මෙම ඡේදයේ (අ) අනුඡේදයේ සඳහන් පරිදි ශ්‍රී ලංකා පුරවැසියන් වන්නා වූ ද ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් සහිත සියලුම නිකුත් කළ කොටස්වලින් සියයට හැටකට නොඅඩු ප්‍රමාණයක් —

(i) මෙම ඡේදයේ (අ) අනුඡේදයේ සඳහන් පරිදි වූ ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් ; හෝ

(ii) මෙම ඡේදයේ (ඈ) අනුඡේදයේ සඳහන් පරිදි වූ නිල ලැයිස්තුගත පොදු සමාගමක් හෝ සමාගම් විසින් ; හෝ

(iii) මෙම ඡේදයේ (ඈ) අනුඡේදයේ සඳහන් වෙනත් යම් සමාගමක් හෝ සමාගම් විසින් හෝ
ඒ සියල්ලන් විසින් හෝ දරනු ලබන්නාවූ ද ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ යම් සමාගමක් අදහස් කෙරේ.

එසේ වුවද, මේ අනුඡේදයේ සඳහන් යම් සමාගමක කොටස් දරන යම් ශ්‍රී ලංකා පුරවැසියකු ඒ කොටස් දරනු ලබන්නේ ශ්‍රී ලංකා පුරවැසියකු නොවන තැනැත්තකුගේ නාමිකයා හෝ භාරය දරන්නා හෝ අනුයෝජිතයා හෝ වශයෙන් නම්, ඔහු ඒ කොටස් දරන්නා හෝ ඉන් යම් කොටසක් දරන්නා නොවන ලෙස සැලකිය යුතුය ;

එසේම තවදුරටත්, නිසි බලධරයා විසින් නියම කරනු ලැබුවහොත්, ඒ කොටස් දරන්නාගේ දිවුරුම් පත්‍රයක් මාර්ග යෙන්, ඒ සමාගම විසින් ඒ සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(ඉ) ඒ දිවුරුම් පත්‍රයක අඩංගු යම් ප්‍රකාශයක් සාවද්‍ය බව දැනගන්නට ලැබුණහොත්, අවස්ථාවෝචිත පරිදි ඒ සමාගමේ බලපත්‍රය හෝ ඒ සමාගමට ප්‍රදානය කර ඇති යම් වරප්‍රසාදයක් හෝ ඒ නිසි බලධරයා විසින් අවලංගු කරනු ලැබීමට, ආපසු ගනු ලැබීමට හෝ අත්හිටුවනු ලැබීමට ඒ සමාගම යටත් වන්නේ ය.

(3) මේ නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ සමාගමක්, ඒ හේතුවෙන්, එහි බලපත්‍රය හෝ නිසි බලධරයා විසින් ඒ සමාගමට ප්‍රදානය කර ඇති යම් වරප්‍රසාදයක් හෝ අවලංගු කරනු ලැබීමට, ආපසු ගනු ලැබීමට හෝ අත්හිටුවනු ලැබීමට යටත් වන්නේ ය.

05-37

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී